# ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය

කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය

# ලංසු සඳහා ආරාධනයයි

**ලංසු නාමය - අධ්‍යක්ෂ මණ්ඩලීය රැස්වීම් ආවරණය කිරීම සඳහා ලේකම් සේවාව ලබා ගැනීම.**

**ලංසු අංකය - NGJA/18/22/2026**

1. ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරියෙහි දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු සභාපති විසින් අධ්‍යක්ෂ මණ්ඩලීය රැස්වීම් ආවරණය කිරීම සඳහා ලේකම් සේවාව ලබා ගැනීමට සුදුසුකම්ලත් ආයතන වෙතින් මුද්‍රා තැබූ මිල ගණන් කැඳවනු ලැබේ.

2. සේවා විෂය පථය පිළිබඳ සවිස්තරාත්මකව ලංසු ලේඛනයේ දක්වා ඇත.

| විස්තරය | ලංසු ඇපකරය (රු.) |
|---|---|
| අධ්‍යක්ෂ මණ්ඩලීය රැස්වීම් ආවරණය කිරීම සඳහා ලේකම් සේවාව ලබා ගැනීම | රු.10,000/- (වලංගු කාලය 2026.05.08 - 2026.09.04) |
| ලංසු පත්‍රිකා ලබා ගැනීම | 2026.04.24 දින සිට 2026.05.07 දක්වා |
| ලංසු පත්‍රිකා විවෘත කිරීම(දිනය/ වේලාව /ස්ථානය ) | 2026.05.08 දින පෙ.ව. 11.00<br>ජා.මැ.ස්ව.අධිකාරිය. - 3 වෙනි මහල සැපයුම් අංශය |

3. ජාතික තරඟකාරී ලංසු කැඳවීමේ (NCB) ක්‍රියාපටිපාටිය භාවිතා කරනු ලබන අතර ලංසු ලේඛනයේ දක්වා ඇති සුදුසුකම් සහ අවශ්‍යතා සපුරාලන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ (GOSL) ප්‍රසම්පාදන මාර්ගෝපදේශවල අර්ථ දක්වා ඇති පරිදි ලංසුකරුවන්ට විවෘත වේ.

4. උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට 2026.04.24 සිට 2026.05.07 දින දක්වා ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය, නාරාහේන්පිට, ලේක් ඩ්‍රයිව් මාවත, අංක 260, RTFC & WMC ගොඩනැගිල්ල, 3 වැනි මහලෙහි සැපයුම් අංශයෙන් කාර්යාල වේලාවන් තුළ වැඩ කරන දිනයන්හි ලංසු පත්‍රිකා පරීක්ෂා කර වැඩිදුර තොරතුරු ලබා ගත හැක. Tel /Fax: 2332197, Email: supply@ngja.gov.lk

5. ලිඛිත ඉල්ලීමක් මගින් ආපසු ගෙවනු නොලබන රු.1,000.00 + SSCL 2.5% + VAT 18% ක මුදලක් (මුළු මුදල = රු.1,209.50), මුදලින් ගෙවීමෙන් පසුව සිංහල බසින් යුත් ලංසු පත්‍රිකා 2026.04.24 සිට 2026.05.07 දින දක්වා සතියේ වැඩ කරන දිනයන්වලදී පෙ.ව. 9.30 සිට ප.ව 3.00 දක්වා කාලය තුළ ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය, නාරාහේන්පිට, ලේක් ඩ්‍රයිව් මාවත, අංක 260, RTFC & WMC ගොඩනැගිල්ලෙහි තුන්වන මහලෙහි පිහිටි සැපයුම් අංශයෙන් ලබා ගත හැක.

6. පූර්ව ලංසු රැස්වීම 2026.05.04 වන දින පෙ.ව. 10.00 ට නාරාහේන්පිට, ලේක් ඩ්‍රයිව් මාවත, අංක 260, RTFC & WMC ගොඩනැගිල්ලෙහි තුන්වෙනි මහලෙහි පිහිටි ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරියේ සැපයුම් අංශයේදී පැවැත්වේ.

7. මුද්‍රා තබන ලද මිල ගණන් පත්‍රිකා 2026.05.08 වන දින පෙ.ව. 11.00 ට හෝ එයට ප්‍රථම සභාපති,දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව, ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය, අංක 260, RTFC & WMC ගොඩනැගිල්ල, ලේක් ඩ්‍රයිව් මාවත, නාරාහේන්පිට, යන ලිපිනයට ලැබීමට සැලැස්වීම හෝ තුන්වෙනි මහලෙහි පිහිටි සැපයුම් අංශයෙහි තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලිය යුතුයි. අයදුම්පත් බහාලන ලිපි කවරයේ වම්පස ඉහළ කෙලවර "ලේකම් සේවාව ලබා ගැනීම - 2026" යනුවෙන් සඳහන් කළ යුතුය.

8. ඉහත සඳහන් පරිදි වාණිජ බැංකුවකින් ලබා ගත් රු.10,000/- වටිනාකමින් යුක්ත බැංකු ඇපකරයක් / ලංසු සුරක්ෂිතයක් ලෙස දින 119 කාලයක් වලංගු වන පරිදි (2026.05.08 දින සිට 2026.09.04 දින දක්වා) හෝ මුදලින් අධිකාරිය වෙත ගෙවීම් කර රිසිට්පත ඉදිරිපත් කළ යුතුය.

9. ලංසු ඉදිරිපත් කිරීමට නියමිත දින සිට දින 91 ක කාලයක් සඳහා ලංසු වලංගු විය යුතුය. (2026.05.08 සිට 2026.08.07)

10. ලංසු ඉදිරිපත් කිරීම සඳහා නියමිත කාලසීමාව අවසන් වූ වහාම, ඉහත 5 ඡේදය සඳහන් ලිපිනයට පෞද්ගලිකව සහභාගී වීමට තෝරා ගන්නා ලංසුකරුවන් හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයන් ඉදිරියේ ලංසු විවෘත කරනු ලැබේ.

11. ලංසු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් ලංසුකරුවන් විසින් දරනු ලබන කිසියම් වියදමක් සඳහා ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය වගකියනු නොලැබේ.


**සභාපති - දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව**

**ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය**

අංක 260, RTFC & WMC ගොඩනැගිල්ල, ලේක් ඩ්‍රයිව් මාවත, නාරාහේන්පිට.

දුරකථන : 0112-329295, 2325364, 2390645-8 ෆැක්ස් : 0112320758, 011-2332197

වෙබ් අඩවිය : **www.ngja.gov.lk**